මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வியம் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வியம் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வியம் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வியம் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வியம் வலயம் මතුගම

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| නාට්‍ය හා රංග කලාව - I | 12 ශ්‍රේණිය | කාලය : පැය 03 යි |
|---|---|---|

**උපදෙස්** - I කොටස - සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

II කොටස- A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

- නිවැරදි පිළිතුර තෝරා ඉදිරියෙන් වරහන තුල යොදන්න.

01. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් ගැමි කලාව හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ සහිත පිළිතුරු කණ්ඩය වනුයේ,

A - ගැමි සමාජීය ඇදහිලි විශ්වාස හා සිරිත් විරිත් පදනම් කරගෙන බිහි වූ කලා විශේෂයකි.

B - ලාලිත්‍යයත් ප්‍රකට කරන කලා විශේෂයකි.

C - රටකට දේශීය සංස්කෘතික ලක්ෂණ පිලිඹිබු කරන නිර්මාණ විශේෂයකි.

D - සංගීතය, චිත්‍ර, නර්තන, නාට්‍ය ආදි සියුම් කලා මේ ගණයට ඇතුලත් වේ.

E - විවිධ සරල රටා හා මෝස්තරවලින් යුක්ත වේ

1. ABC 2. ACE 3. ABE 4. CDE 5. BD

02. නාට්‍ය සම්බන්ධයෙන් නොගැලපෙන වරහන තෝරන්න. ( )

1. හිස් පුටු ගොඩක් ඉදිරියේ වුව ද රඟ දැක්විය හැක
2. නළු - ප්‍රේක්ෂක සහ සම්බන්ධය පවත්වා ගැනීම පහසුය
3. නළු නිලියන් තමන්ගේ සංවාද කණ්ඩ වනපොත් කර ගැනීමට
4. නාට්‍ය ඉදිරිපත් කිරීමට විශාල පිරිසකගේ සහය අත්‍යවශ්‍ය වේ
5. සෑම නාට්‍ය දර්ශනයකටම නාට්‍ය අධ්‍යක්ෂවරයා ක්‍රියාකාරීව සිටීම වැදගත් වේ

03. ප්‍රාසංගික කලා පමණක් ඇතුලත් වාරණය වනුයේ, ( )

1. නර්තනය, නාට්‍ය, චිත්‍ර, සංගීතය
2. සංගීතය, නර්තනය, මූර්ති, කැටයම්
3. මූර්ති, කැටයම්, රූකඩ, අත්කම්
4. මුද්‍රා නාට්‍ය, නාට්‍ය, ගීත නාට්‍ය,ඔපෙරා
5. චිත්‍ර, මුද්‍ර නාට්‍ය, ටෙලි නාට්‍ය, සිනමාව

04. රංග අභ්‍යාසයක් නොවන්නේ, ( )

1. ශිථිලකරණය
2. මකර වලිගය
3. ක්ෂණික නිරූපණ
4. ශ්වසන අභ්‍යාස
5. පරිකල්පන අභ්‍යාස

05. රංග ක්‍රීඩාවකින් අපේක්ෂා කරනුයේ, ( )

1. සහයෝගීතාව එකමුතුකම වර්ධනය කර ගැනීම
2. සිත සැහැල්ලු කර ගැනීම
3. නළු කාර්ය වර්ධනය කර ගැනීම
4. කටහඬ ප්‍රගුණ කර ගැනීම
5. ඉහත කිසිවක් නොවේ

06. නාට්‍ය සංගීතයක නොතිබිය යුතු ලක්ෂණයක් වන්නේ, ( )

1. නාට්‍ය අධ්‍යක්ෂවරයාට අවශ්‍ය වන ආකාරයට පමණක් සංගීතය යොදා ගැනීම
2. සංගීත අධ්‍යක්ෂවරයාට තමාට අභිමත පරිදිම සංගීතය මෙහයෙ වීම
3. නාට්‍ය ගීත නළුවනට පහසුවෙන් ගැයීමට හැකි ලෙස සරල තනුවලින් නිර්මාණය කිරීම
4. නාට්‍ය ගීත වල උපයුක්ත භාෂාව උගත් නූගත් කාහටත් පහසුවෙන් තේරුම් ගත හැකි වීම
5. නාට්‍යමය අවස්ථා තීව්‍ර කර ගැනීම සඳහා පසුබිම් සංගීතය යොදා ගැනීම

07. " විභාව" යනු, ( )

1. රසයක් ඉපැදවීමට හේතුවන මනෝභාවයකි
2. ස්ථායී භාවයක් අවදි කරවීමට හේතු කාරක වන්නා වූ සාධකයකි
3. "ආනුභාව" යන්නට පර්යායවාචී ශබ්දයකි
4. සාත්වික භාවයන්ගෙන් එකකි
5. මනසේ පරිපාලනයෙන් තොරව බිහි වන්නකි

08. "රසිකයෙක්" යනු, ( )

1. ඕනෑම රසිකයෙකු හඳුන්වන නාමයකි
2. උසස් නිර්මාණයක් කිරීමට සමත් කලාකරුවා
3. නාට්‍යයක් රසවත්ව ඉදිරිපත් කරන්නාය
4. සහෘදයා යන්නට සමාන අර්ථ ගෙන දේ
5. ප්‍රතිභා හා ව්‍යුත්පත්ති ශක්තියෙන් යුක්ත වූවකි

09. ලෝක ධර්මී සම්ප්‍රදායන්ට අයත් නොවන නාට්‍යයක් වනුයේ, ( )

1. වෙරි වත්ත
2. සෙල්ලම්ගෙය
3. මගුල් ප්‍රස්ථාව
4. නරිබෑනා
5. කැලණි පාලම

10. නාට්‍ය ධර්මී සම්ප්‍රදායේ දක්නට ලැබෙන ලක්ෂණයක් නොවන්නේ, ( )

1. ලාලිත්‍යයෙන් යුතු අංග වින්‍යාසයෙන් වඩා එසවුනු පියවර තබමින් හා ගමන් කිරීම
2. විවිධ නියම අනුව රංග මත ඉදිරිපත් කරනු ලබන කක්ෂ්‍යා විභාගය සිදු කිරීම
3. පසුතල නිර්මාණ ඉතා විචිත්‍රවත් ලෙසත් අපූර්ව ලෙසත් වේදිකාව මත තැබීම
4. ආත්ම භාෂණ ස්වගතම් අපරිවාරිත වැනි දෑ වේදිකාව මත ඉදිරිපත් කිරීම
5. බොහෝවිට ඓතිහාසික කථා ජාතක කතා ආදිය පදනම් කර ගැනීම

11. කාව්‍ය ශාස්ත්‍රය නම් කෘතියේ අන්තර්ගත කාව්‍ය වර්ගයක් නොවන්නේ, ( )

1. ට්‍රැජඩි 2. කොමඩි 3. වීර කාව්‍ය 4. සැටර් 5. දෘශ්‍ය කාව්‍ය

12. කාව්‍ය ශාස්ත්‍රයේ පරිච්ඡේද ගණන වනුයේ, ( )

1. 36 කි 2. 34 කි 3. 35 කි 4. 32 කි 5. 30 කි

13. ඇරිස්ටෝටල් සඳහන් කරන පරිදි ශෝකාත්මයක වැදගත්ම අංගයක් වන්නේ, ( )

1. කථා වින්‍යාසයයි 2. චරිත නිර්මාණයයි 3. අනාවරණයයි
4. පශ්චාත් දෘෂ්ටිකථනන රීතිය 5. ප්‍රෙක්ෂාව

14. නාට්‍යයක දැකිය හැකි අනුශාංගික අංග ඇතුලත් වරණය වන්නේ, ( )

1. ප්‍රේක්ෂාව, අංගරචනය, වේෂ භූෂණය,සංගීතය
2. සංගීතය, අංගරචනය, වේෂ භූෂණය, නාට්‍යෝපකරණ
3. අංගරචනය, නාට්‍යෝපකරණය, අධ්‍යක්ෂණය, රංගභූමි තාක්ෂණය
4. රංගවින්‍යාසය, රංගභූමි තාක්ෂණය, රංගභූමි පාලනය, රංගභූමි අලංකරණය
5. නාට්‍යෝපකරණ, සංගීතය, නර්තනය, ප්‍රෙක්ෂාව

15. කුවේණි නාට්‍ය තුල දක්නට ලැබෙන චරිතයක් නොවන්නේ, ( )

1. විනිසුරු 2. දඩයක්කරු 3. දිසාලා 4. ධීවරයා 5. නීතිඥවරු

- පහත දැක්වෙන මාතෘකා ආශ්‍රයෙන් 16 සිට 21 දක්වා ප්‍රශ්නවලට පිලිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - නෘත | E - ගුරුගේ මාලාව | I - ඉක්නෙව්ටා |
| B - හතරැස් වේදිකා | F - පිංතූර රාමු වේදිකාව | J - මන්දිර වේදිකා |
| C - මිලින්ද ප්‍රශ්නය | G - නෘත්‍ය | K - පැජන්ට් වේදිකා |
| D - කුක්ලොප්ස් | H - ගබඩාකොල්ලය | L - දොරකඩ අස්න |

16. "නාට්" යන ධාතුවෙන් නිර්මාණය වී ඇත. ( )

17. සැටුර නාට්‍ය දෙකකි ( )

18. මධ්‍යකාලීන යුගයේ භාවිතා වූ වේදිකා වර්ග 2 කි ( )

19. ප්‍රොසීනියම් වේදිකාව හඳුන්වන නාම 2 කි. ( )

20. නාට්‍යමය ලක්ෂණ සහිත බෞද්ධ පූජා කර්ම 2 කි. ( )

21. උඩරට සම්ප්‍රදාය තුල පවත්වන ප්‍රධාන ශාන්තිකර්මයේ නාට්‍යමය අවස්ථා 2 කි. ( )

- අංක 22 සිට 24 දක්වා එක් එක් ප්‍රශ්නය සඳහා කරුණු / සංකල්ප/නාම 5 බැගින් දී ඇත. ඒ අතුරින් සෙසු පද හා <u>නොගැලපෙන</u> එක් පදයක් ඇත. එය තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුල යොදන්න.

22. 1. කරලිය 2. කමත 3. තානායම්පොල 4. සභය
5. යාග මඩල ( )

23. 1. ඊස්කිලස් 2. සොෆොක්ලීස් 3. ඇගමෙම්නන් 4. යුරිපිඩීස්
5. තෙස්පීස් ( )

24. 1. කැතාසිස්කරණය 2. ත්‍රිවිධ ඒකීයත්වය 3. භාව විශෝධනය 4. යත්න
5. වාග් විලාසය ( )

- නිවැරදි පිළිතුර ඉදිරියෙන් ඇති වරහන තුල යොදන්න.

25. ප්‍රෙක්ෂාව යන්නට නිවැරදි පිළිතුර වන්නේ, ( )
1. නාට්‍යයක අත්‍යවශ්‍යම අංග ත්‍රිත්වයෙන් එකකි
2. නාට්‍ය රචකයාගේ කාර්යයකි
3. රූපණය යන්නට සමාන අර්ථ ගෙන දෙයි
4. නූතන වේදිකාව මත නාට්‍යයක නිරූපිත අවස්ථා වඩා චමත්කාර කර ගැනීම සඳහා සිදු කරන තාක්ෂණික උපක්‍රමයකි
5. නාට්‍යයක් නරඹන විට ප්‍රේක්ෂකයා ඉදිරියේ රංගභූමිය මත මොහොතින් මොහොත මැවෙන දර්ශනයකි

26. රංග භූමි පාලකයා හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශයක් නොවන්නේ, ( )
1. ඉතා හොඳ නාට්‍යයක් වුවද වේදිකා පරිපාලකගේ දුර්වලත්වය හේතුවෙන් අසාර්ථක විය හැක
2. මොහු අර්ථපති ලෙසද අර්ථ දක්වයි
3. නාට්‍ය නිෂ්පාදනයේදී දර්ශන සංවිධානය කිරීම රංගභූමිය හා නළු නිළියන් සම්බන්ධ සියළුම කටයුතු කිරීම මොහුගේ කාර්යයකි
4. නාට්‍ය අධ්‍යක්ෂවරයාට අමතරව රංග භූමියේ සියලු කටයුතු වල වගකීම දරන්නේ රංග භූමි පරිපාලකයා
5. නාට්‍යයකට සම්බන්ධ වන සියලුම දෙනා මෙහෙයවීමේ වගකීම ඔහුට පවරණ ලදි

27. රංග භූමි තාක්ෂණය හා සම්බන්ධ නොගැලපෙන ප්‍රකාශය වන්නේ, ( )

1. නූතන ප්‍රොසීනියම් වේදිකාව මත නාට්‍යයක නිරූපිත අවස්ථා වඩා චමත්කාර කර ගැනීමට වර්තමානයේ තාක්ෂණික උපක්‍රම බෙහෙවින් භාවිතා කෙරේ
2. මෙමගින් ත්‍රාසය විස්මය ගැටුම් අවස්ථා ඉතා සියුම් ලෙස දැනවීමට හැකියාව පවතී
3. නාට්‍යයක් රඟ දැක්වීමේදී වේදිකාව සැකසීමේ පටන් නිෂ්පාදන කාර්ය පරිසමාප්තියට පත්වන අවස්ථාව තෙක් අයත්වේ
4. නාට්‍යයට සම්බන්ධවන සියලුම දෙනා මෙහෙයවමින් නාට්‍ය දර්ශන ආරම්භ කිරීමත් පවත්වා ගෙන යාමත් මෙහි කාර්ය වේ
5. විදුලි කෙටීම හෙණ හඬ ආදී වේදිකාවේ මවා පෙන්වීමට මෙම තාක්ෂණික ප්‍රයෝග භාවිතා කරයි

28. ක්ෂණික නිරූපණයක් පිලිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතරින් නිවැරදි පිළිතුර වනුයේ, ( )

1. ඒකල හෝ සාමූහික වශයෙන් ඉදිරිපත් කිරීමට හැකිවේ
2. පෙර පුහුණුවීමකින් හා නිර්මාණය කරන ලද පිටපතකට අනුව සිදු කල යුතුය
3. එක් එක් චරිතයට අවශ්‍ය පරිදි බාහිර සමාරෝපය ඉතා විශිෂ්ඨ ලෙස සිදු කල යුතුය
4. ප්‍රබල තේමාවක් කථා වස්තුවක් දක්නට ලැබේ
5. පසුතල නිර්මාණ බහුලව යොදා ගත හැක

29. සොෆොක්ලීස් ගේ නාට්‍ය නිර්මාණයක් වන්නේ, ( )

1. කොලෝනස් හි ඊඩිපස් 2. මීඩියා 3. හිපොලීටස්
4. මණ්ඩූකයෝ 5. කුරුල්ලෝ

- ප්‍රශ්න අංක 30 සිට 35 දක්වා ප්‍රශ්න වලට පහත දැක්වෙන කරුණු උපයෝගි කර ගනිමින් පිළිතුරු සපයන්න.

A - කරදිය B - සාමය C - මිස්ටරි D - මිරකල්
E - නට්ක්‍රැකර් F - දෙපානෝ

30. අත්භූත ජනක නාට්‍ය හැඳින්වීමට භාවිතා කරන වචනයකි ( )

31. ලොව ප්‍රකට බැලේ නාට්‍යයක් සඳහා උදාහරණයකි ( )

32. ඩබ්. බී. මකුලොලුව මහතා විසින් නිර්මාණය කරන ලද ඉතා විශිෂ්ඨ ගීත නාටකයකි ( )

33. චිත්‍රසේන මහතා විසින් නිර්මාණය කරන ලද ඉතා විශිෂ්ඨ මුද්‍රා නාට්‍යයකට උදාහරණයකි ( )

34. ක්‍රි.පූ. 421 ඇරිස්ටොෆනීස් විසින් රචිත කොමඩි නාට්‍යයකි ( )

35. සාන්තුවරයන්ගේ ජීවිතවල ඇති ප්‍රාතිහාර්ය අවස්ථා මෙමගින් නිරූපණය කරනු ලබයි ( )

- නොගැලපෙන පිළිතුර තිත් ඉරිමත ලියන්න.

36. 1. දෙබරු 2. සිටුවරු 3. වලාකුළු 4. ලයිස්ට්‍රාටා
5. ඇජැක්ස් ( )

37. 1. මඟුල් ප්‍රස්ථාව 2. හරිම බඩු හයක් 3. පීතෘ 4. නරිබෑනා
5. වෙරිවත්ත ( )

38. 1. මෝදර මෝල 2. සිංහබාහු 3. මනමේ 4. වහලක් නැති ගෙයක්
5. හරිම බඩු හයක් ( )

39. "ඉඳුරා කියමි මම නුඹට පව්කාරයෙකි නුඹ මෙලොව තම නෑසියන් ........" ( )
ඉහත ප්‍රකාශය අන්තර්ගත නාට්‍යය හා එය ඉදිරිපත් කරන චරිතය තෝරන්න.
1. ජූලියස් සීසර් නාට්‍යයේ බ්රූටස්
2. ඊඩිපස් නාට්‍යයේ අන්ධ ඍෂිවරයා
3. රූකඩ ගෙදර නාට්‍යයේ හෙල්මා
4. ඊඩිපස් නාට්‍යයේ ක්‍රියෝන්
5. කුවේණි නාට්‍යයේ විනිශ්චකරු

40. "පහන් එළියේ චන්ද්‍ර මඩලේ
සිහින් සෙවනැලි වැටෙන යාමේ
ඒ අතර හැංගි මුවා වී ............"
කුවේණි නාට්‍යයේ ඉහත ප්‍රකාශය සිදු කරනුයේ, ( )
1. දිසාලා 2. කුවේණි 3. විනිශ්චයකරු 4. ජීවහත්ත 5. නීතිඥයා

## II කොටස

- A කොටසින් ප්‍රශ්න 2 ක් ද B කොටසින් ප්‍රශ්න 2 ක්ද බැගින් මුළු ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

### A කොටස

01. 1. ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන නාට්‍යමය ලක්ෂණ සහිත බෞද්ධ පූජා කර්ම 4 ක් නම් කරන්න. ( ල. 4 )
    2. එම පූජා කර්මයන්හි දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ 6 ක් ලියන්න. ( ල. 5 )
    3. නාට්‍යමය ලක්ෂණ සහිත බෞද්ධ පූජා කර්මයක නාට්‍යමය ලක්ෂණ සවිස්තරව විස්තර කරන්න. ( ල . 6 )

02. 1. ශ්‍රී ලංකාවේ පවත්වනු ලබන ශාන්ති කර්ම 4 ක් දක්වන්න. ( ල. 4 )
    2. ඉන් ශාන්තිකර්ම දෙකක දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ සහිත පූජාංග 2 බැගින් දක්වන්න. ( ල . 5 )
    3. ඉහත සඳහන් කල නාට්‍යමය ලක්ෂණ සහිත එක් පූජාංගයක නාට්‍යමය ලක්ෂණ පිලිබඳ විස්තරාත්මක විග්‍රහයක යෙදෙන්න. ( ල . 6 )

03. 1. ඔබ දන්නා රංග අභ්‍යාස 4 ක් නම් කරන්න. ( ල . 4 )
    2. රූපණ ශිල්පියෙකුට හෝ ශිල්පිනියකට රංග අභ්‍යාසයක් කිරීම තුලින් ලබා ගත හැකි ප්‍රයෝජන පිලිබඳ පැහැදිලි කරන්න. ( ල . 5 )
    3. ඔබ දන්නා රංග ක්‍රීඩා 2 ක් නම් කර ඉන් ලබාගත හැකි ප්‍රයෝජන පිලිබඳ කෙටි විස්තරයක් ලියා දක්වන්න. ( ල . 6 )

04. 1. මූලාශ්‍රයේ දැක්වෙන කුවේණී කථා පුවතේ හා හෙන්රි ජයසේනයන් විසින් නිර්මාණය කරන ලද වෙනස්කම් 4 ක් ලියන්න. ( ල . 4 )
    2. හෙන්රි ජයසේනයන් සිය කුවේණී නාට්‍ය තුලින් කුවේණීගේ මාතෘත්වය විදහා දක්වන ආකාරය උදාහරණ සහිතව පහදන්න. ( ල . 5 )
    3. සමස්ථයක් වශයෙන් කුවේණී නාට්‍ය පෙලෙහි ප්‍රේක්ෂකයන්ට ගම්‍ය කරවන තේමාව උදාහරණ සහිතව විස්තර කරන්න. ( ල . 6 )

### B කොටස

05. 1. ග්‍රීක නාට්‍ය කලාවේ ප්‍රභවය කෙටියෙන් පහදන්න. ( ල . 4 )
    2. ග්‍රීක නාට්‍ය ප්‍රභේද 3 නම් කර ඉන් ප්‍රභේදයක් පිලිබඳ පැහැදිලි කරන්න. ( ල . 5 )
    3. ග්‍රීක (trajady) ට්‍රැජඩි නාට්‍ය ප්‍රභේදය පෝෂණය කිරීමෙහිලා සොෆොක්ලීස් දැක් වූ මෙහෙය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. ( ල . 6 )

06. 1. ග්‍රීක රංග භූමියේ කොටස් 4 ක් විස්තර කරන්න. ( ල . 4 )
    2. ග්‍රීක රංග භූමියේ විකාශනය රූපසටහන් සහිතව පැහැදිලි කරන්න. ( ල . 5 )
    3. නාට්‍ය ප්‍රදර්ශනය කරන ස්ථානය අනුව රංග ශෛලිය හැඩගැසෙන ආකාරය ග්‍රීක රංග භූමිය තුලින් විස්තර කරන්න. ( ල . 6 )

07. 1. මධ්‍ය කාලීන යුගයේ පැවති ජන වන්දනා නාට්‍ය ප්‍රභේද 3 ලියා දක්වන්න. ( ල . 3 )

2. ඉන් එක් නාට්‍ය ප්‍රභේදයක් කෙටි හැඳින්වීමක් කර එහි ලක්ෂණ පිළිබඳ පැහැදිලි කරන්න. ( ල . 6 )

3. මධ්‍ය කාලීන යුගයේ භාවිතා කළ වේදිකා පිළිබඳ විස්තරාත්මක පැහැදිලි කිරීමක් කරන්න. ( ල . 6 )

08. 1. ඊඩිපස් නාට්‍යයේ තේමාව කෙටියෙන් පහදන්න. ( ල . 4 )

2. ඇරිස්ටෝටල් දක්වා ඇති ශෝකාත්මත නාට්‍යයක මූලිකාංග 6 සොෆොක්ලීස්ගේ ඊඩිපස් නාට්‍ය ඇසුරින් විස්තර කරන්න. ( ල . 5 )

3. ග්‍රීක ශෝකාන්ත නාට්‍යයක වීරයාගේ චරිත ලක්ෂණ ඊඩිපස් රජ නාට්‍ය ඇසුරින් උදාහරණ සහිතව පහදන්න. ( ල . 6 )

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்யம் வல்யம மතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்யம் வல்யம

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2020 මාර්තු

| නාට්‍ය හා රංග කලාව - II | 12 ශ්‍රේණිය | කාලය : පැය 03 යි |
|---|---|---|

**උපදෙස්** - I කොටස - සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

II කොටස- A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

- නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුරේ අංකය ඉදිරියෙහි ඇති වරහන් තුළ ලියන්න.

(01). ඇරිස්ටෝටල් විසින් නාට්‍යයේ වැදගත්ම අංගය ලෙස සැලකුවේ,

1. චින්තනය 2. ප්‍රේක්ෂාව 3. වාග් විලාසය
4. චරිතය 5. කතා වින්‍යාසය (.........)

(02). 'කුක්ලෝප්ස්' යනු,

1. ග්‍රීක ට්‍රැජඩියකි 2. ග්‍රීක කොමඩියකි 3. රෝම ප්‍රහසනයකි.
4. ග්‍රීක සටුර නාටකයකි. 5. රෝම ට්‍රැජඩියකි (.........)

(03). ග්‍රීක නාට්‍ය තාත්විකත්වය කරා යොමු කිරීමේ පුරෝගාමියා වන්නේ,

1. ඇරිස්ටොෆානිස් ය. 2. ඊස්කිලස් ය. 3. සොෆොක්ලීස්ය
4. යුරිපිඩීස් ය. 5. මිනැන්ඩර් ය. (.........)

(04). ග්‍රීක සටුර නාට්‍ය පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නොගැලපෙන ප්‍රකාශය වන්නේ,

1. ට්‍රැජඩි තුනක් අවසානයේ සටුර නාටකයක් රඟ දැක්වීය.
2. සටුර නාටකයක් නම් කෙරුනේ එහි ගායනවෘන්දය අනුවය.
3. සොෆොක්ලීස්ගේ ඉග්නෙව්ටායි යනු සැටර් නාට්‍යකි.
4. සටුර නාටක හාස්‍යෝත්පාදක නාට්‍ය විශේෂයකි.
5. යුරිපිඩිස්ගේ මීඩියා යනු සටුර නාටකයකි. (.........)

(05). ග්‍රීක ට්‍රැජඩියේ ලක්ෂණයක් නොවන්නේ,

1. නාට්‍ය පෙළ රචනයේදී පශ්චාත් දෘෂ්ටිකථන ක්‍රමය අනුගමනය කිරීම ය.
2. සාත්වික අභිනය මැනවින් යොදාගෙන තිබීම ය.
3. රංගාලෝකන ක්‍රමයක් යොදා නොගැනීම ය.
4. නාට්‍ය දර්ශන තරඟාකාරයෙන් පවත්වනු ලැබීම ය.
5. බිහිසුනු දර්ශන වේදිකාව මත ඉදිරිපත් නොකිරීම ය. (.........)

(06). ලෝකයේ පැරණිම නාටක සාහිත්‍ය අයත් වන්නේ,

1. ඉන්දියාවටයි. 2. ග්‍රීසියටයි. 3. යුරෝපයටයි. 4. ජපානයටයි. 5. රෝමයටයි. (.........)

(07). ට්‍රැජඩියක කතා නායකයා,

1. සැම විටම දෛවය හා සටන් වදියි. 2. නිරන්තරයෙන්ම හාස්‍යට ලක්වේ.
3. නිරන්තරයෙන්ම දැනුවත්ව වැරදි කරයි. 4. සැම විටම ස්වකීය අභිමතාර්ථ ඉටු කර ගනියි.
5. නිරන්තරයෙන්ම විකට සංවාදයන්හි යෙදෙයි. (.........)

(08). ප්‍රථම වරට ඩිතිරැම්බෝස් ගායක වෘන්දයට එක් වූ නළුවා වන්නේ,

1. පෙරියන්ඩර් ය. 2. අරියොන් ය. 3. තෙස්පිස් ය.
4. සොලොන් ය. 5. මෙනන්ඩ්‍රොස් ය. (.........)

(09). මුල්ම මධ්‍යකාලීන ජනවන්දනා නාට්‍ය ලෙස සැලකෙන්නේ,

1. පළමු එඩේරාගේ කතාව ය. 2. මරියවරුන් තිදෙනාගේ කතාව ය.
3. දෙවන එඩේරාගේ කතාව ය. 4. ආදම්ගේ කතාව ය.
5. දූවේ රජතුන්කට්ටුව ය. (.........)

(10). ඊඩිපස් නාට්‍යයේ වේදිකාව මත රඟ දක්වා පෙන්වන අවස්ථාවක් විය හැක්කේ,

1. ඊඩිපස් නෙත් අඳ කර ගැනීමය. 2. යොකස්ට්‍රා නෙත් අඳ කර ගැනීමය.
3. ඊඩිපස් අතින් ලායුස් ඝාතනය වීමය. 4. යොකස්ට්‍රා ඊඩිපස් වෙතින් ශෝකීව නික්ම යාම.
5. ස්ෆින්ක්ස් ප්‍රහේලිකා විමසීමයි. (.........)

- ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්න සඳහා පහත සඳහන් පින්තූරය ඇසුරින් පිළිතුරු සපයන්න.




(11). ඉහත රූපයේ දැක්වෙන වේදිකාවේ A අක්ෂරයෙන් දැක්වනුයේ,

1. පැරඩොස් ය. 2. තයිම්ලිය. 3. ලොජියම්ය.
4. ප්‍රේක්ෂකාංගනයයි. 5. රංග භූමියයි. (.........)

(12). ඉහත රූපයේ B අක්ෂරයෙන් දැක්වෙනුයේ,

1. පැරසීනියම් ය. 2. පැරඩොස් ය. 3. ඔකෙස්ට්‍රා ය. 4. ප්‍රොසීනියම් ය. 5. ස්කිනි ය. (.........)

(13). ඉහත රූපයේ C අක්ෂරයෙන් දැක්වෙනුයේ,

1. ස්කිනි ය. 2. පැරසීනියම් ය. 3. එපිසීනියම් ය. 4. පැරඩෝස් ය. 5. ඔකෙස්ට්‍රා ය. (.........)

(14). ඉහත රූපයේ D අක්ෂරයෙන් දැක්වෙනුයේ,

1. එපිසීනියම් ය. 2. පැරසීනියම් ය. 3. ලොජියම් ය. 4. ඔකෙස්ට්‍රා ය. 5. තයිම්ලිය. (.........)

(15). ඉහත රූපයේ E අක්ෂරයෙන් දැක්වෙනුයේ,

1. ප්‍රොසීනියම් ය. 2. ලොජියම් ය. 3. තයිම්ලිය. 4. පැරඩෝස් ය. 5. එපිසීනියම් ය. (.........)

(16). නාට්‍ය විචාරයකට අදාල නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. නාට්‍ය විචාරය පිළිබඳ පැරණිම ග්‍රන්ථ රචනා වූයේ ශෝකජනක නාට්‍යවලට අදාලවය.
2. නාට්‍ය විචාරය පිළිබඳව පිළිගත් සිද්ධාන්ත කිසිවක් නැත.
3. නාට්‍ය විචාරකයා හොඳ රසිකයෙක් නොවේ.
4. නාට්‍ය විචාරය සිදුවන්නේ අපරදිග නාට්‍ය කලාවේ පමණි.
5. නාට්‍ය කලාවේ අභිවෘද්ධිය සඳහා විචාර කලාවක් අත්‍යාවශ්‍ය ය. (.........)

(17). 'රුකඩ ගෙදර' නාට්‍ය,

1. ප්‍රහසනයකි. 2. කොමඩි නාටකයකි. 3. රොමැන්ටික් නාටකයකි.
4. අති නාටකයකි. 5. යථාර්තවාදී නාටකයකි. (.........)

(18). වේදිකා නාට්‍ය ආනුශාංගික අංග පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. ආනුශාංගික අංග නාට්‍යක ප්‍රේක්ෂාවට බලපෑමක් කරන්නේ නැත.
2. රංගාලෝකය මීට අයත් නොවේ.
3. ආනුශාංගික අංග උපරිම වශයෙන් යෙදීමෙන් නාට්‍යක් සාර්ථක වේ.
4. පෙරදිග සංකල්ප අනුව ආහාර්ය අභිනයට අයත් වේ.
5. අධ්‍යක්ෂකවරයාගේ මැදිහත්වීම අවශ්‍ය (.........)

(19). Caravan"යනු,

1. ග්‍රීසියේ එළිමහන් රංග පීඨයයි. 2. මධ්‍යකාලීන නාට්‍ය කලාවේ සංදර්ශන කරත්තයයි.
3. ග්ලෝබ් රංග භූමියේ එළිමහන් අවකාශයයි. 4. රෝම රඟමඬලේ ප්‍රේක්ෂක ගෘහයයි.
5. ඔකෙස්ට්‍රාවයි. (.........)

(20). කිතුනු ශාන්තුවරයන්ගේ ජීවිත අලලා නිර්මාණය වූ නාට්‍ය වන්නේ,

1 මිස්ටරි 2. මිරැකල් 3. මොරැලිටි 4. ප්‍රහසන 5. පාස්කු (.........)

(21). හේන්රික් ඉබ්සන් රචනාකළ නාට්‍ය පමණක් අඩංගු ගොනුව තෝරන්න.

1 වන තාරාවා, සමාජයේ කුළුණු, ජන හතුරා
2. ගොඩෝ එනකං , හිරු දහසක්, අවතාර
3 මිස් ජුලී, සමාජ කුලුණු, චේරිවත්ත
4 චෙරිවත්ත, මකරා, රොස්මරෝස්
5 අවතාර, ගොඩෝ එනකං, මිස් ජුලී (.........)

(22). ග්‍රීක නාට්‍ය සම්ප්‍රදාය සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,

1 සියලු චරිත රඟපාන ලද්දේ පිරිමින් විසින්ය

2 ග්‍රීක ට්‍රැජඩි නාට්‍යයේ රංග ශෛලිය ලෝකධර්මීය

3 සෑම පිරිමියෙක්ම වෙස් මුහුණු පැළඳ රංගනයේ යෙදිණි.

4 නර්තන විලාසයක් හා සංගීත සංයෝජන දක්නට ලැබිණි

5 ''එකුක්ලීමා'' යන්ත්‍රය මගින් මළ සිරුරු වේදිකාවට ගෙන්වන ලදි (.........)

(23). යුරිපිඩිස් විසින් රචිත ට්‍රැජඩි නාට්‍යයක් වන්නේ,

1 ඉලෙක්ට්‍රා 2 ඇග්මෙනෝන් 3 ලයිසිස්ට්‍රා 4 වළාකුළු 5 මීඩියා (.........)

(24). මිනිසකුගේ සදාචාරය පිළිබඳ සාකච්ඡා කරන නාට්‍ය සම්ප්‍රදාය,

1 මිස්ටරි 2 මිරකල් 3 මොරැලිටි 4 පසන් 5 තිර්ලානා (.........)

(25). ඩෝල්ස් හවුස් නාට්‍යයේ මුල් පිටපත රචනා වී ඇත්තේ,

1. ඉංග්‍රීසි භාෂාවෙනි 2. රුසියන් භාෂාවෙනි 3. ග්‍රීක භාෂාවෙනි

4. නොර්විජියානු භාෂාවෙනි 5. ප්‍රංශ භාෂාවෙනි (.........)

(26). 'නාට්‍ය යනු ජීවිතයේ අනුකරණයකැයි' ප්‍රථමවරට ප්‍රකාශ කරන ලද්දේ

1. ඇරිස්ටෝටල් 2. භරතමුනි 3. ධනංජය 4. ප්ලේටෝ 5. සොක්‍රටීස් (.........)

(27). ග්‍රීක කොමඩියක ප්‍රධාන ලක්ෂණයක් නොවන්නේ,

1. විසිහතර දෙනෙකුගෙන් යුත් ගායන වෘන්දනයක් යොදා ගැනීම.

2. නාට්‍ය ප්‍රීතියෙන් කෙළවර වීම.

3 නළුවන් වෙස් මුහුණ යොදා ගැනීම.

4. ගායන වෘන්දනය සටුරයන්ගෙන් සමන්විත වීම.

5 ඇරිස්ටොෆනිස් විසින් කොමඩි රචනා කිරීම. (.........)

(28). තියොට්‍රෝන් යනු,

1. එලිසබතීනු යුගයේ ප්‍රේක්ෂකාගාරයක නමකි.

2. පැරණි ග්‍රීක නාට්‍ය සඳහා මුදල් යෙදවූ තැනැත්තාය.

3. ග්‍රීක නාට්‍යයේ ප්‍රේක්ෂකයා නාට්‍ය නැරඹූ ස්ථානයයි.

4 නෝ නාට්‍ය ශාලවකට අයත් අංගයකි.

5. රූකඩ ගෙදර රඟ දැක්වූ වේදිකාවයි. (.........)

(29). බූත්, බහු වේදිකා භාවිතා කෙරුනේ,

1. ග්‍රීක නාට්‍ය කලාවෙහි ය. 2. මධ්‍යකාලීන යුරෝපීය කලාවෙහි ය. 3. රෝම නාට්‍ය කලාවෙහිය.

4. සංස්කෘත නාට්‍ය කලාවෙහිය. 5 යුරෝපීය නාට්‍ය කලාවෙහිය. (.........)

● පහත දී ඇති වගුව ආශ්‍රයෙන් 30 - 34 දක්වා ප්‍රශ්නවලට පිලිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| **A** ඇගමෙනොන් | **F** දෙබරු | **K** අල්තාරය | **B** පැරඩොස් |
| **G** බොයිපොයිරොයි | **L** නත්තල් ගස | **C** කුරුල්ලෝ | **H** මැකරුන් |
| **M** මාර්තා ග්‍රැහැම් | **D** තරන්තලා නැටුම | **I** රොබට් ඩී. නීරෝ | **N** එව්මිනිඩස් |
| **E** මාලන් බ්‍රැන්ඩෝ | **J** ස්කිනය | **O** වළාකුළු | |

(30). ඊස්කිලස්ගේ ඔරෙස්ට්‍රියා ත්‍රිකය වනුයේ,

1 AGN 2 AFK 3 BGK 4 CFK 5 AFK (.........)

(31). ග්‍රීක රංග භූමිය හා සම්බන්ධ වනුයේ,

1 BFL 2 BJK 3 BJO 4 JEC 5 BIK (.........)

(32). ග්‍රීක කොමඩි නාට්‍ය වනුයේ,

1 CGN 2 AGO 3 CFO 4 CGN 5 AFO (.........)

(33). යථාර්ථවාදී නාට්‍යයක් හා සම්බන්ධ වනුයේ,

1 CHL 2 AHO 3 CFO 4 DHL 5 DJL (.........)

(34). රූපණ ශිල්පය හා සම්බන්ධ වනුයේ,

1 EIM 2 EGN 3 AGM 4 AGN 5 EGM (.........)

(35). පැරණි ග්‍රීක නාට්‍ය,

1. රඟ දක්වන ලද්දේ සන්ධ්‍යා භාගයේදී ය. 2. නාට්‍ය කෘතිය අංක වලට බෙදා තිබුණි.
3. නාට්‍ය රචකයා හැඳින්වූයේ 'කවි' යන නමිනි. 4. සතර අභිනයම යොදා ගැනුණි.
5. නිෂ්පාදනය භාර වූයේ වෘත්තිකයෙකුට ය. (.........)

(36). 'ඔරෙස්ටියා' නාට්‍ය ත්‍රිකය නිර්මාණය කළේ,

1. ඇරිස්ටොෆනිස් ය. 2. ඊස්කිලස් ය. 3. සොෆොක්ලීස් ය.
4. යුරිපිඩීස් ය. 5. අරිස්ටෝටල් ය. (.........)

(37). නාට්‍යකින් ඉටුවිය යුතු අරමුණ වනුයේ,

1. ප්‍රේක්ෂකයාට උසස් රස වින්දනයක් ලබා දීම.
2. විදග්ධ ප්‍රේක්ෂක පිරිසට ගෝචර වීම.
3. ප්‍රේක්ෂකයා ආනන්දයෙන් ප්‍රඥාව වෙත ගෙන යාම.
4. තත්කාලීන දේශපාලන හා සමාජ තත්වය නිරූපණය කිරීම.
5. වේදිකාව මත නිතරම සුන්දර දර්ශන (.........)

(38). සාර්ථක නළුවෙකු වීමට අවශ්‍ය ලක්ෂණ හා ගුණාංග වනුයේ,

1. මනා රූ සපුවක් තිබීම　　2. ප්‍රතිභාව හා කැපවීම　　3. ශාරීරික යෝග්‍යතාව

4. පරිකල්පනයෙන් තොරවීම　　5. කටහඬෙහි තීව්‍රතාවය　　(.........)

(39) පහත දැක්වෙන නාට්‍ය ඇසුරෙන් ග්‍රීක ප්‍රහසන නාට්‍යක් වන්නේ,

1. ඉග්නෙව්ටායි　　2. ප්‍රොමිතියස් බන්ධනය　　3. කුක්ලොප්ස්

4. අල්කීස්ටිස්　　5. වලාකුළුය.　　(.........)

(40) වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. සෑම නාට්‍යක්ම තාත්විකය

2. සෑම නාට්‍යක්ම නාට්‍ය ධර්මීය.

3. ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී එකට සංයෝග කළ නොහැක.

4. බොහෝ නාට්‍ය ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී දෙකේ සංකලනයෙන් ඉදිරිපත් කරයි.

5. සියළුම ප්‍රකාශ අසත්‍යයි.　　(.........)

## II කොටස

- A කොටසින් ප්‍රශ්න 2 ක් ද B කොටසින් ප්‍රශ්න 2 ක්ද බැගින් මුළු ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

### A කොටස

01. 1. ශෝකාන්ත පිළිබඳව ඇරිස්ටෝටල්ගේ විග්‍රහය විස්තර කරන්න.
    2. ඊඩිපස් නාට්‍යයේ ඊඩිපස්ගේ ජීවිතය හැලහැප්පීම්වලට භාජනය වීමට දෛවය හේතු වූවා ද? විමසන්න.
    3. ඊඩිපස් නාට්‍යය ග්‍රීක නාට්‍ය කලාවේ විශිෂ්ඨ ශෝකාන්තයකි. සාකච්ඡා කරන්න.

02. 1. ග්‍රීක නාට්‍ය කලාවේ ත්‍රිවිධ ඒකීයත්වය යන්න පිළිබඳ විස්තරයක් කරන්න.
    2. ශෝකන්ත නාට්‍යයක චරිත පිළිබඳ විග්‍රහයේ දී චරිතයකට ස්වභාවය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
    3. එම හැඳින්වීම සමග ඊඩිපස් චරිතය පිළිබඳ විමසීමක් කරන්න.

03. 1. ග්‍රීක කොමඩි නාට්‍ය පිළිබඳ විමර්ශනයක් කරන්න.
    2. ග්‍රීක කොමි නාට්‍යයේ වර්ධනයට ඇරිස්ටොෆොනිස්ගෙන් සිදු වූ දායකත්වය පෙන්වා දෙන්න.
    3. ඇරිස්ටොෆනිස්ගේ නාට්‍යවල දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් විස්තර කරන්න.

### B කොටස

04. 1. මධ්‍යකාලීන යුරෝපයේ ජන වන්දනා නාට්‍ය කලාවේ පසුබිම පිළිබඳ විස්තරයක් කරන්න.
    2. ජන වන්දනා නාට්‍ය රඟ දැක්වූ ස්ථාන හා වේදිකාව පිළිබඳ විස්තර කරන්න.
    3. මොරැලිටි නාට්‍ය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

05. 1. යුරෝපයේ යථාර්ථවාදී නාට්‍යය කලාප බිහිවීමට බලපෑ හේතු විස්තර කරන්න.
    2. හෙන්රික් ඉබ්සන් නම් නාට්‍යකරුවා පිළිබඳ හැඳින්වීමක් කරන්න.
    3. "රූකඩ ගෙදර" නාට්‍ය බටහිර නාට්‍ය සම්ප්‍රදායේ වැදගත් සන්ධිස්ථානයකි. පැහැදිලි කරන්න.

06. 1. "රූකඩ ගෙදර" නාට්‍යයේ තේමාව පිළිබඳ විමසීමක් කරන්න.
    2. "රූකඩ ගෙදර" නාට්‍යයේ එන ගැටුම ප්‍රබලව ඉදිරිපත් කිරීම සඳහා තෝරාගෙන තියෙන ප්‍රධාන සිදුවීම් පෙළ ගස්වන්න.
    3. නුවුරාගේ චරිතය හා හෙල්මර්ගේ චරිතය පිළිබඳ විමර්ශනාත්මක සාකච්ඡාවක් කරන්න.


12 ශ්‍රේණිය - නාට්‍ය හා රංග කලාව